

"හායි මම ඇන්ඩි. ඔයා දන්නවද අපේ මොළය , නිතරම අපට එන ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් ලබාගන්නවා."

"හිතන්න ඔයා උණුම උණු තේ කෝප්පයක් ඇල්ලුවා කියලා. ඔයා අත පිලිස්සුනා කියලා හිතන්නත් කලින් ඔයාගෙ අතින් කෝප්පය අතහැරෙනවා නේද.

මොකද ඔයාගෙ මොළය ගැටලුව හඳුනාගෙන ඉක්මනින් ම විසඳුමක් ලබාගෙන. "

ඒ කියන්නෙ ඔයා දැනටමත් දන්නවා අපි මේ කතා කරන දේ ගැන.



Mr සෑම්ට පොඩි ගැටලුවක් ඇති වෙලා. අපි උදවු කරමු.

Mr සෑම්ට ස්මාර්ට් දුරකතනයක් මිලදී ගන්න අවශ්‍ය වෙලා.

ඔයා මොනවාද දෙන උපදෙස් Mr සෑම්ට?

1. ස්මාර්ට් දුරකතන විකුණන වෙළඳසැලකට යන්න
2. ළඟ ඇති මුදලට ලබාගත හැකි ස්මාර්ට් දුරකතන මොනවාද අසන්න.
3. අවශ්‍යතාවයට සරිලන දුරකතනයක් තෝරාගන්න.
4. මුදල් ගෙවීම් කරන්න.
5. රිසිට් පත ලබාගන්න.

හරිම සරලයි නේද? ඉතින් මේ වගේ ගැටලුවක් විසඳීමේ පියවර අපි ඇල්ගොරිතමයක් කියලා හඳුන්වනවා.



Mr සෑම්ට තවත් ගැටලුවක් ඇති වුනා. ස්මාර්ට් දුරකතන වෙළඳසැලේ දි. ඒ මොන වර්ගයේ දුරකතනයක් ද මිලදී ගන්නේ කියලා.

එයාට විසඳුම් 3ක් තිබුනා.

1. Apple දුරකතනයක් මිලදී ගැනීම
2. Samsung දුරකතනයක් මිලදී ගැනීම
3. Huawei දුරකතනයක් මිලදී ගැනීම

මෙන්න මේ වගේ විසඳුම් එකට වඩා තිබෙනවා නම් ඒවා විකල්ප විසඳුම් කියලා කියනවා.

මේ ගැන වැඩිදුරටත් දැනගන්න කියවීම් පොතේ 1.1 කොටස බලන්න.



සමහර ගැටලු හෝ එවායේ කොටස් විසදීමට

- පියවරෙන් පියවර ඉදිරියට යන්න වෙනවා. හරියටම ඔයා ගේම්(Game) එකකදි ඊලඟ මට්ටමට (Next level) යනවා වගේ. ඔයාට ගේම් එක දිනන්න ඕනෙ නම් හැම මට්ටමකටම පිළිවෙලින් යන්න වෙනවා. (අනුක්‍රමය)

- තවත් සමහර අවස්ථා තියනවා Mr සැම්ට වුනා වගේ විකල්ප විසදුම් දෙකක් හෝ ඊට වඩා තිබෙන.  එතන දි අපි වඩාත්ම ගැලපෙන විසඳුම් තෝරාගන ඉදිරියට යනවා. ( වරණය )

- එකම කාර්‍යයක් නැවත නැවත සිදු වෙන්න වෙනවා. හරියටම ඔයා ෆෝන් එලාම් එක ඔන් කරලා නිදාගෙන ඉන්නවා නම් ඕෆ් කරන තුරුම එලාම් එක හැම විනාඩි 5කට වතාවක්ම නාද වෙනවා. එලාම් එකට ඔයා දුන්නු වෙලාව 4.00 නම්, 4.00ට 4.05ට, 4.10ට ... නැවත නැවත එකම ක්‍රියාව සිදුවෙනවා. ( පුනර්කරණය )

කියවීම් පොත 1.2 බලන්න.



හොඳයි, ඔයා දැන් ගැටළු විසදීම ගැන හොඳින්ම දන්නවා.

ඒත් බලන්න අපි විසඳුම වාක්‍ය විදියට ලියුවාම ඒක ටිකක් පැහැදිලි මදි. ආදානයක් දුන්නෙ මොන අවස්තාවෙදි ද තීරණයක් ගත්තෙ මොන අවස්තාවෙදි ද ආරම්භ වුනේ අවසාන වුනේ කොහොමද කියන එක අපිට හොඳින් කියවලා බලන්නේ නැතිව හඳුනාගන්න අමාරුයි.

ඉතින් අපිට ඕනෙ විසඳුම දැකපු ගමන් හැම අවස්තාවක් ගැනම අදහසක් ගන්න අපි අඳිනවා ගැලීම් සටහන.

කියවීම් පොත 1.3.1 බලන්න.

